Australian Government | Australian Charities and Not-for-profits Commission

ACNC සහ පුණ්‍යායතනවල වගකීම්

ACNC ලෙසින්ද හඳුන්වන, ඕස්ට්‍රේලියානු පුණ්‍යායතන සහ ලාභ නොලබන සංවිධාන කොමිෂන් සභාව යනු පුණ්‍යායතන සඳහා ජාතික නියාමන ආයතනයයි. පුණ්‍යායතන නීති රීති පිළිපදින්නේද, ඔවුන්ගේ කාර්යභාරය හොඳින් ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගන්නේද යන්න සහතික කිරීම සඳහා අපි සහාය දක්වමු.

මෙම නීති පුණ්‍යායතනය හොඳින් පාලනය කරනු ලබන බවට — හොඳ පාලන ක්‍රමයක් ඇති බවට සහතික කිරීමට උපකාරී වේ. මෙයින් අදහස් වන්නේ, මුදල් යා යුතු තැන්වලටම යාම, පුණ්‍යායතනය උදව් කරන පුද්ගලයන් ආරක්ෂිතව තැබීම, ගැටළු ඉක්මනින් හඳුනා ගැනීමට හැකිවීම, සංවිධානය දිගුකාලීනව පැවතීම, සහ ජනතාවට පරිත්‍යාග කිරීමට හෝ සහාය දීමට විශ්වාසය ඇති වීමවේ.

අපි සංවිධාන ACNC සමඟ පුණ්‍යායතන ලෙස ලියාපදිංචි කරමින්, ඔවුන්ට පුණ්‍යායතන බවට පත් කිරීමටද අනුමත කරමු. ලියාපදිංචි වීමෙන් පුණ්‍යායතනයට තම කාර්යභාරය සඳහා උපකාරී වන නීතිමය සහ බදු වාසි ලබාගැනීමට හැකියාව ලැබේ. ACNC මගින් බදු වාසි සඳහා වන අයදුම්පත් ඔස්ට්‍රේලියානු බදු දෙපාර්තමේන්තුව (ATO) වෙත යොමු කරයි, පුණ්‍යායතනයට බදු වට්ටම් ලබාගත හැකිද යන්න තීරණය කරන්නේ ATO මගිනි.

ACNC මඟින් ඔස්ට්‍රේලියාවේ ලියාපදිංචි සියලුම පුණ්‍යායතන ඇතුළත්, නොමිලේ භාවිත කළ හැකි මාර්ගස්ථ ACNC පුණ්‍යායතන ලියාපදිංචි නාමාවලියද පවත්වාගෙන යයි.

පුණ්‍යායතන ලියාපදිංචි නාමාවලියෙහි, පුණ්‍යායතන පිළිබඳ වැදගත් තොරතුරු ඇතුලත්, ඔවුන්ගේ සම්බන්ධතා විස්තර, ඔවුන් කරන කාර්යයන්, ඔවුන් උදව් කරන පුද්ගලයන්, සංවිධානය පාලනය කරන අය, සහ ඔවුන්ගේ මූල්‍ය තොරතුරු දැක්වෙයි.

පුණ්‍යායතනයකට පරිත්‍යාග කිරීමට හෝ ස්වේච්ඡා සේවයට එක්වීමට පෙර, එම පුණ්‍යායතනය ACNC මඟින් නිල වශයෙන් ලියාපදිංචි වී ඇත්දැයි පරීක්ෂා කිරීමට පුණ්‍යායතන ලියාපදිංචි නාමාවලිය බැලීම හොඳ අදහසකි.

පුණ්‍යායතනය ලියාපදිංචි නාමාවලියේ ඇතුළත් නම්, ඔබේ පරිත්‍යාගය සැබෑ පුණ්‍යායතනයකට යන බව විශ්වාසයෙන් සිටිය හැක.

පුණ්‍යායතන සඳහා, ලියාපදිංචි නාමාවලියේ ඇතුළත් වීමෙන් ජනතාවට ඔබේ සංවිධානය පිළිබඳ යාවත්කාලීන තොරතුරු දැකගැනීමට හැකි වන අතර, ඔබ නිවැරදි ලෙස ක්‍රියා කරන බවත් පෙන්වයි.

සෑම වසරකම මිලියන ගණනක් සෙවුම් පුණ්‍යායතන ලියාපදිංචි නාමාවලියේ සිදු වන බැවින්, පුණ්‍යායතන තොරතුරු නිවැරදිව සහ යාවත්කාලීනව තබාගැනීම ඉතා වැදගත්ය.

ඔස්ට්‍රේලියනුවන් පරිත්‍යාග කිරීමට, ස්වේච්ඡා සේවයට එක්වීමට, හෝ වෙනත් ආකාරයකින් සහය දීමට පෙර, පුණ්‍යායතන සැබෑදැයි පරීක්ෂා කිරීමට පුණ්‍යායතන ලියාපදිංචි නාමාවලිය භාවිත කරයි.

පුණ්‍යායතනවල වගකීම්:

ACNC මඟින් ලියාපදිංචි පුණ්‍යායතන ලෙස පවත්වා ගැනීම සඳහා, පුණ්‍යායතන අනුගමනය කළ යුතු වැදගත් නීති රීති ඇත.

මෙයට ඔවුන් කරන සියලු කටයුතු තම පුණ්‍ය අරමුණට සහාය වන බව සහතික කිරීමද ඇතුළත් වේ. අරමුණ යනු පුණ්‍යායතනය ස්ථාපිත කළේ කුමන හේතුවක් නිසාද යන්නයි — උදාහරණයක් ලෙස, සමාජයේ මිනිසුන්ට සහාය වීම. නව මණ්ඩල සාමාජිකයන් පත් කිරීම, හෝ සම්බන්ධතා තොරතුරු වෙනස් වීම වැනි වැදගත් විස්තර සමඟින් ACNC යාවත්කාලීන කළ යුතුය. පුණ්‍යායතන තම මූල්‍ය තොරතුරු සහ ඔවුන් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ ලේඛන වැනි හොඳ වාර්තා තබාගත යුතුය. ලේඛන වෙනත් භාෂාවකින් තබාගත හැකි නමුත්, අවශ්‍ය වුවහොත් ඉංග්‍රීසි භාෂාවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි ලෙස තිබිය යුතුය.

සෑම වසරකම, පුණ්‍යායතන තමන් කළ කටයුතු සහ පසුගිය වසර සඳහා ඔවුන්ගේ මුදල් කෙසේ භාවිත කළේද යන්න පැහැදිලි කරන, මාර්ගස්ථ වාර්ෂික තොරතුරු ප්‍රකාශනයක් පුරවිය යුතුය.

ලියාපදිංචි පුණ්‍යායතන, පුණ්‍යායතනයක් කෙසේ පාලනය කළ යුතුද යන්න විස්තර කරන පාලන ප්‍රමිතීන් හයක් අනුගමනය කළ යුතුය. විදේශයේ කටයුතු කරන හෝ විදේශයට මුදල් යවන පුණ්‍යායතන, බාහිර හැසිරීම් ප්‍රමිතීන් ලෙස හඳුන්වන අමතර ප්‍රමිතීන් හතරක් අනුගමනය කළ යුතුය.

ලියාපදිංචි පුණ්‍යායතන මෙම ප්‍රමිතීන් තේරුම් ගෙන අනුගමනය කිරීම ඉතා වැදගත්ය, මන්ද ඒවා පුණ්‍යායතන ක්ෂේත්‍රයේ අවංකභාවය සහ විවෘතභාවය ඇති සංස්කෘතියක් ගොඩනැගීමට උපකාරීවීමවේ.